සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade : 11 | විෂයය / பாடம் / Subject : දෙවන බස (සිංහල) / இரண்டாம் மொழி (சிங்களம்) | පත්‍රය / வினாத்தாள் / Paper : II | කාලය / காலம் / Time : පැය 02 / மணி02 |

සැලකිය යුතුයි

- **I** කොටසෙහි 1 හා 2 ප්‍රශ්නය ද **II** කොටසින් එක් ප්‍රශ්නයක් ද, **III** කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු ලියන්න.
- பகுதி I லிருந்து 1ஆம் 2ஆம் வினாக்களுக்கும் பகுதி II லிருந்து ஏதாவத ஒரு வினாவுக்கும் பகுதி III லிருந்து இரு வினாக்களுக்குமாக மொத்தம் ஐந்து வினாக்களுக்கு மட்டும் விடை எழுதுக.

## I කොටස / பகுதி I

1. දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන වචන 100ක පමණ රචනයක් ලියන්න.
பின்வரும் தலைப்புக்களில் ஒன்றைத் தெரிவு செய்து தரப்பட்ட விடயங்களை உள்ளடக்கி ஏறத்தாழ 100 சொற்கள் அமையுமாறு கட்டுரை ஒன்று எழுதுக.

(01) (අ) ලොවට ම තර්ජනයක් වූ කොරෝනා වෛරස් රෝගය.
(1) මෙම රෝගය පිළිබඳ හැඳින්වීම
(2) මෙම රෝගය නිසා ඇති වූ බලපෑම්
(3) මෙම රෝගයේ රෝග ලක්ෂණ
(4) එයින් වැළකීමට ගතහැකි ක්‍රියාමාර්ග
(5) සමාලෝචනය

(ආ) පොදු දේපළ ආරක්ෂා කරමු.
(1) පොදු දේපළ පිළිබඳ හැඳින්වීම
(2) පොදු දේපළ වලින් ඇති ප්‍රයෝජන
(3) පොදු දේපළ වලට සිදුවන හානි
(4) එම හානි වළක්වා ගැනීමට ගතහැකි පියවර
(5) සමාලෝචනය.

(ඉ) මා ගුරුවරයකු වුවහොත්
(1) කල්පිත මාතෘකාවක් ලෙස කරුණු දැක්වීම
(2) ගුරුවරයකු වුවහොත් කරන දේවල්
(3) ගුරුවරයකු බවට පත්වීම
(4) එවිට තමා තුළ ඇතිවන හැඟීම
(5) සමාලෝචනය.

(ඊ) පොතක් කතා කරයි.

(1) පොතක වැදගත්කම හැඳින්වීම

(2) පොත්වලින් මිනිසාට ඇති ප්‍රයෝජන

(3) මිනිස් කටයුතු නිසා පොත්වලට වන හානි

(4) පොත් ආරක්ෂා කිරීමේ වැදගත්කම

(5) සමාලෝචනය

(උ) වැඩිහිටියන්ට ගරු කරමු.

(1) වැඩිහිටියන් කවුරුන්දැයි හැඳින්වීම

(2) වැඩිහිටියන්ට අද ඇතිවී තිබෙන තත්ත්වය

(3) වැඩිහිටියන් රැක බලාගතයුත්තේ ඇයි

(4) ඒ සඳහා අපට කළහැකි දේවල්

(5) සමාලෝචනය

(02) දී ඇති පින්තූරය බලා ඒ ඇසුරින් අර්ථවත් **වාක්‍ය 5ක්** ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන **4ක්** වත් තිබිය යුතුයි.)
பின்வரும் படத்தை அடிப்படையாகக் கொண்டு ஐந்து கருத்துள்ள வாக்கியங்களை எழுதுக. (ஒரு வாக்கியத்தில் நான்கு சொற்களுக்குக் குறையாமல் இருத்தல் வேண்டும்)



(1) ........................................................................................................................

(2) ........................................................................................................................

(3) ........................................................................................................................

(4) ........................................................................................................................

(5) ........................................................................................................................

## II කොටස / பகுதி II

- **3,4 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**
  3, 4ஆம் வினாக்களுள் ஒன்றுக்கு மட்டும் விடை எழுதுக.

(03) පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் பாடலை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.

ඇහැළ මලින් ගස් පිරිලා
බලන්න හරි ලස්සනයි
අඹ රඹුටන් ජම්බු ඉදිලා
අද හැම තැන හරි හැඩයි

දොඹ ගස් යට මල් හැලිලා
සුවඳක් හැම තැන දැනෙයි
වලිකුකුළන් හඬලන කොට
අහං ඉන්න හරි හිතයි

ගස්වල දලු නැළවෙන කොට
ඇඟට හරි ම සීතලයි
ඉගිළෙන අර සමනලයින්
අල්ලන්නට බැරි හැඩයි

(1) මෙම ගීතයේ ලස්සන යැයි කියන්නේ කුමන මල් ද?
(2) මෙහි සඳහන්වන පලතුරු මොනවා ද?
(3) මෙහි සඳහන් සුවඳක් ඇතිකරන මල් මොනවා ද?
(4) ගීතයේ සඳහන් පක්ෂියාගේ නම කුමක් ද?
(5) ඇඟට සීතලක් දැනෙන්නේ කුමක් නිසා ද?

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் பந்திலை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.

''සුබ උදෑසනක් ! අද අපේ පාසලට විශේෂ දවසක්. මේ වසරේ සිංහල භාෂා තරගය ගිය සුමානේ කොළඹ දී පැවැත්වුණා. එහි කථික හා නිවේදන අංශවල රන් පදක්කම් අපේ පාසලට ලැබුණා. එම ජයග්‍රහණ ලබා ගත්තේ දහවන ශ්‍රේණියේ සඳලි වක්වැල්ල සිසුවිය යි. අපේ පාසලට කීර්තියක් ලබා දුන් එම සිසුවියට මම සුබ පතනවා.''

(1) සිංහල භාෂා දිනය පැවැත්වුණේ කොහේ ද?
(2) එහි ජයග්‍රහණ ලැබුණු තරග මොනවා ද?
(3) එම ජයග්‍රහණ ලබාගත්තේ කවුරුන් ද?
(4) ඇය ඉගෙනගත්තේ කුමන පන්තියේ ද?
(5) පහත පදවලට විරුද්ධ පද ලියන්න.
    කීර්තිය -
    ජයග්‍රහණය -

## III කොටස / பகுதி III

- **5 - 6 ප්‍රශ්න දෙකට ම උත්තර ලියන්න.**
  5 ஆம் 6ஆம் வினாக்களுக்கு விடை எழுதுக.

(05) ඔබේ පාසලේ සිසුන්ට අවශ්‍ය ක්‍රිකට් ක්‍රීඩා උපකරණ නොමැතිකම නිසා සිසුන්ගේ ක්‍රීඩා කටයුතු වලට එය විශාල බාධාවක්ව පවතී. එනිසා ඔබේ පාසලට ක්‍රිකට් ක්‍රීඩා උපකරණ කට්ටලයක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඔබේ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමාට ලිපියක් ලියන්න. ඔබ පාසලේ ක්‍රීඩා සංගමයේ ලේකම් යැයි සිතන්න.

නැතහොත් / அல்லது

ඔබේ පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයට ආරාධනා කරමින් දෙමාපියන් වෙත යැවීමට ආරාධනා පත්‍රයක් පිළියෙල කරන්න. උත්සවය 2020-11-15 වැනි දින ප.ව. 2.00 ට ඔබේ පාසලේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්වේ. එදින ප්‍රධාන අමුත්තා ලෙස සහභාගිවන්නේ පළාත් අධ්‍යාපන ඇමතිතුමා ය.

(06) පහත දැක්වෙන දෙමළ වාක්‍ය හෝ ඉංග්‍රීසි වාක්‍ය හෝ සිංහලට පරිවර්තනය කරන්න.
பின்வரும் தமிழ் / ஆங்கில வாக்கியங்களை சிங்களத்தில் மொழிபெயர்க்குக.

(1) எனது பொழுதுபோக்கு புத்தங்கள் வாசித்தலாகும்
(2) இன்று ஒரு மழை நாளாகும்
(3) சுத்தமான நீரை பருகுவோம்.
(4) இந்தியா எமது அயல் நாடாகும்.
(5) இலங்கையில் நான் விரும்பும் நகரம் கண்டியாகும்.

(1) My hobby is reading books.
(2) Today is a Rainy day.
(3) Will drink clean water.
(4) India is our neighboring country.
(5) Kandy is the city that I like in Sri Lanka'

නැතහොත්
அல்லது

ඔබේ හැඳුනුම්පත නැතිවීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට පොලීසියට ගිය අවස්ථාවේ පොලිස් නිලධාරියා හා ඔබ අතර ඇතිවන සංවාදය ලියන්න.
உங்கள் அடையாள அட்டை தொழைந்தது சம்பந்தமாக முறையீடு செய்ய போலீசுக்கு செறன்ற போது போலீஸ் அதிகாரிக்கும் உங்களுக்குமிடையே நடைபெறும் உரையாடல் ஒன்றை பின்வரும் விடயங்களின் கீழ் எழுதுக.

(1) ආමන්ත්‍රණය හා ආචාරය.
(2) පැමිණි කාරණය දැනුම්දීම.
(3) හැඳුනුම්පත නැතිවූ ආකාරය පිළිබඳ තොරතුරු විමසීම.
(4) ඒ පිළිබඳව තොරතුරු දැනුම්දීම.
(5) ස්තුතිය හා ආචාරය